# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

ලංසු නාමය: **<u>2025 අගෝස්තු මස 15,16,17 යන දිනවලදී රත්නපුර " ග්‍රෑන්ඩ් සිල්වරේ"හි පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා උත්සව කළමනාකරණ ආයතනයක් තෝරා ගැනීම</u>**

ලංසු අංකය **: NGJA/18/50/2025 - 02**

1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2025 අගෝස්තු මස15,16,17 යන දිනවලදී රත්නපුර " ග්‍රෑන්ඩ් සිල්වරේ"හි පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා උත්සව කළමනාකරණ ආයතනයක් තෝරා ගැනීමට සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| ලංසු ඇපකරය | රු. 400,000/- (2025.07.02 සිට 2025.07.30දක්වා) |
| ලංසු පත්‍රිකා ලබා ගැනීම | 2025.06.11 සිට 2025.07.01 දක්වා පෙ.ව.9.30 සිට ප.ව.3.00 දක්වා |
| ලංසු පත්‍රිකා විවෘත කිරීම(දිනය/ වේලාව /ස්ථානය ) | 2025.07.02 පෙ.ව.10.05 ජ.මැ.ස්ව.අධිකාරියෙහි 7 වන මහලෙහි ශ්‍රවණාගාරයේදී |

2. ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රමවේදයට අනුකූලව ප්‍රසම්පාදනය සිදු කෙරේ. (NCB)

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලිඛිත ඉල්ලීමක් මඟින් ආපසු ගෙවනු නොලබන රු රු.3,500.00 + 2.5% SSCL (රු.87.50) + 18% VAT (රු.645.75) ක මුළු මුදල = රු.4,233.25, මුදල් අයකැමි වෙත මුදලින් ගෙවීමෙන් පසුව ඉංග්‍රීසි බසින් යුත් ලංසු පත්‍රිකා 2025.06.11 සිට 2025.07.01 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්වලදී පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, අංක-12, "මැක්සන්ස් ටවර්", ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03, යන ලිපිනයෙහි 4 වන මහලෙහි පිහිටි සැපයුම් අංශයෙන් ලබා ගත හැක.

4. මුද්‍රා තබන ලද මිල ගණන් පත්‍රිකා 2025.07.02 වන දින පෙ.ව.10.00 හෝ ඊට ප්‍රථම සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, අංක-12, "මැක්සන්ස් ටවර්", ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03, යන ලිපිනයට ලැබීමට සැලැස්වීම හෝ 4 වන මහලෙහි පිහිටි සැපයුම් අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවර **"රත්නපුර ප්‍රදර්ශනය සඳහා උත්සව කළමනාකරණ ආයතනයක් තෝරා ගැනීම - 2025"** යනුවෙන් සඳහන් කල යුතුය.

5. පූර්ව ලංසු රැස්වීම 2025.06.20 වන දින පෙ.ව.10.00 ට කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, "මැක්සන්ස් ටවර්" අංක-12, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 7 වන මහලෙහි ශ්‍රවණාගාරයේදි පැවැත්වේ.

6. ඉහත සඳහන් පරිදි වාණිජ බැංකුවකින් ලබා ගත් රු.400,000/- ක වටිනාකමින් යුක්ත බැංකු ඇපකරයක් / ලංසු සුරක්ෂිතයක් ලෙස හෝ මුදලින් අධිකාරිය වෙත ගෙවීම් කර රිසිට්පත ඉදිරිපත් කල යුතුය. (2025.07.02 දින සිට 2025.07.30 දින දක්වා)
7. ලංසු ඉදිරිපත් කිරීමට නියමිත දින සිට දින 91 ක කාලයක් සඳහා ලංසු වලංගු විය යුතුය.(2025.07.02 සිට 2025.10.01)

8. ලංසුපත් විවෘත කිරීම කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, "මැක්සන්ස් ටවර්", අංක-12, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි 7 වන මහලෙහි ශ්‍රවණාගාරයේදී 2025.07.02 වන දින පෙ.ව.10.05 ට සිදු කරන අතර පෙ.ව.10.00 ට පසුව ලැබෙන ලංසු පත්‍රිකා විවෘත කිරීමකින් තොරව අවලංගු කරනු ලැබේ. එම විවෘත කිරීම සඳහා ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

9. ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන කිසියම් වියදමක් සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වගකියනු නොලැබේ.

වැඩි විස්තර සඳහා : - සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - දු.ක. : 011 2332197 / ඊ මේල් : supply@ngja.gov.lk


**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

අංක-12, "මැක්සන්ස් ටවර්", ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03.

දුරකථන : 0112-329295, 2325364, 2390645-8 ෆැක්ස් : 0112320758, 011-2332197

වෙබ් අඩවිය : **www.ngja.gov.lk**